# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1861/39 - 2014 මැයි මස 09 වැනි සිකුරාදා - 2014.05.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය**

සිවිල් ගුවන් සේවා අධිකාරිය

**196 ගුවන් සංතරණ රෙගුලාසි යටතේ සිවිල් ගුවන් සේවා අධ්‍යක්‍ෂ ජනරාල්වරයා විසින් කෙරෙන දැනුම් දීම**

පුද්ගලික ගුවන් මෙහෙයුම්, (Private Operation), ගුවනේදී සිදුකරන කාර්යයන් (Aerial work Operation), අභ්‍යන්තර කුලී මෙහෙයුම් ගුවන් ප්‍රවාහන සේවාවක් (Domestic-Charter Operation) හා අභ්‍යන්තර විධිමත් ගුවන් ප්‍රවාහන සේවාවක් (Domestic-Regular Public Transport Operation), ජාත්‍යන්තර කුලී මෙහෙයුම් ගුවන් ප්‍රවාහන සේවාවක් (International - Charter Operation) හා ජාත්‍යන්තර විධිමත් ගුවන් නැව් බඩු ප්‍රවාහන සේවාවක් (International-Regular Public Transport Operation for Cargo) රට තුළ පවත්වාගෙන යාම සඳහා සිවිල් ගුවන් සේවා පනත හා ඊට අදාල රෙගුලාසි හා කොන්දේසිවලට අනුකූලව ගුවන් මෙහෙයුම් සහතිකය සහ බලපත්‍රය ලබා ගැනීම සඳහා කොළඹ 2, ග්ලෙනී වීදිය, අංක 92, එස්. එස්. කුළුනෙහි පළමු වන මහලේ පිහිටි සීමාසහිත ෆ්ලයි සදර්න් (පුද්ගලික) සමාගම විසින් 2014 මාර්තු මස 10 දාතමින් ඉල්ලුම්පත්‍රයක් 2014 අප්‍රේල් මස 22 වැනි දින මෙම කාර්යාලය වෙත එවනු ලැබ ඇති බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. අයදුම්පතට අනුව සීමාසහිත ෆ්ලයි සදර්න් (පුද්ගලික) සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩලය මෙසේය.

සමිත අබේගුණවර්ධන මහතා
ටී. දිලන්ති සූරියපතිරන මහත්මිය

එකී සමාගමේ යෝජිත ගුවන් මෙහෙයුම් කටයුතු පිළිබඳ පූර්ණ වගකීම කළමණාකාරිත්වය සඳහා සමිත අබේගුණවර්ධන මහතා සීමාසහිත ෆ්ලයි සදර්න් (පුද්ගලික) සමාගම විසින් නම් කරනු ලැබ ඇත.

අයදුම්කරුගේ සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රයේ පිටපතක් කොළඹ 02, හුණුපිටිය පාර, අංක 04, සිවිල් ගුවන් සේවා අධිකාරියේ බිම් මහලේ පිහිටි තාක්ෂණික පුස්තකාලයේ තබා ඇති අතර ඕනෑම වැඩකරන දිනෙක කාර්යාල වේලාවන් තුළ මහජනතාවට පරීක්ෂා කර බැලීමට හැකිය.

යෝජිත මෙහෙයුම් සඳහා අවශ්‍ය ගුවන් මෙහෙයුම් සහතිකය (Air Operator Certificate) ඇතුළු අනෙකුත් අදාල අනුමැතීන් ප්‍රදානය කිරීමට ප්‍රථම, සිවිල් ගුවන් සේවා පනත ගුවන් සංතරණ රෙගුලාසි මෙන්ම අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ නිර්දේශිත ක්‍රියාමාර්ගයන්


*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(International Standard and Recommended Practices)සහ මෙම ආයතනය විසින් පිළිගත් ඒ හා සම්බන්ධිත දේශීය අවශ්‍යතාවයන්ට අනුව නිරූපිත වූත් ආරක්ෂිත වූත් ගුවන් ප්‍රවාහන සේවා මෙහෙයුම් පැවැත්වීම සඳහා අයදුම්කරුවන්ගේ යෝග්‍යතාවය සංස්ථාපිත ක්‍රියාමාර්ගානුකූලව නිසි පරිදි පරීක්ෂා කර බලා මෙම අයදුම්පත සහතික කිරීමේ වැඩ පිළිවෙල 2014 ජූනි මස 4 වැනි දිනට පසුව මවිසින් ආරම්භ කිරීමට තීරණය කර ඇති බව මහජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

*ඉහත පරිච්ඡේදයේ සඳහන් දිනට දින 10කට ප්‍රථම ඕනෑම පුද්ගලයෙකු හට ඉහත කී අයදුම්පත සම්බන්ධව ලිඛිතව, නිශ්චිත හේතු පදනම් කරගත් කරුණු, ගගන නාවික සංතරණ රෙගුලාසිවලට අනුකූලව මා වෙත සංදේශනයන කල හැකිය. අන්තර්ගත සියලු ප්‍රකාශනවල නිරවද්‍යතාවය ලිඛිත සාක්ෂි සමග ඉදිරිපත් කළ යුතු ය.* එවැනි සංදේශන මා වෙත ඉදිරිපත් කරන අවස්ථාවේදී ඔහු/ඇය විසින් එහි පිටපතක් අයදුම්කරුට ලැබීමට සැලැස්විය යුතු අතර, එසේ යැවූ බවට සහතිකයක් අදාළ සංදේශයට අමුණා තිබිය යුතු ය.

එච්. එම්. සී. නිමල්සිරි,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ
ප්‍රධාන විධායක නිලධාරී.

2014 මැයි මස 9 වැනි දින,
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,
අංක 04,
හුණුපිටිය පාර,
කොළඹ 02.

05-653

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.